# රැකියා ඇබෑර්තු



## පරිපාලන නිලධාරී හා කළමනාකරණ සහකාර තනතුරු සඳහා බඳවා ගැනීම

## මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

### නැගෙනහිර පළාත

නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් පහත තනතුරු 02 ක සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සෑම අයදුම්කරුවෙකුම**

- නැගෙනහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන රාජකාරී මනාව ඉටුකිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

### පරිපාලන නිලධාරී - II වන ශ්‍රේණියට

**අධ්‍යාපන සුදුසුකම් :**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කලා / වාණිජ / කළමනාකරණය / පරිගණක / තොරතුරු තාක්ෂණ / මානව සම්පත් කළමනාකරණ උපාධියක් ලබා තිබීම

සහ

ii. රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අධීක්ෂණ නිලධාරීයෙකු ලෙස වසර 05 ක වෘත්තීමය පළපුරුද්ද.

iii. සිංහල / දෙමළ / ඉංග්‍රීසි යන භාෂා හැසිරවීම පිළිබඳ මනා පළපුරුද්දක් තිබීම.

**සැ.යු. :** තොරතුරු තාක්ෂණය සම්බන්ධව ලබා ඇති සුදුසුකම් අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**වයස :** අවුරුදු 22 නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය :** JM 1-1 - 2016

**වැටුප් පරිමාණය රුපියල් :** 42,600 - 10x755 - 18x1,135 - 70,580/- (කළ. සේ. චක්‍ර. අංක : 02/2016 ට අනුව)

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත නිලධාරියා පත්කරනු ඇත.

### කළමනාකරණ සහකාර - III වන ශ්‍රේණියට

**අධ්‍යාපන සුදුසුකම් :**

i. සිංහල / දෙමළ, ගණිතය ඇතුලු සම්මාන 4 ක් සහිතව එක් වරක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයේ විෂයන් 06 කින් සමත්වීම සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව සමත්වීම

සහ

ii. සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයන් 03 කින් සමත්වීම.

iii. සිංහල / දෙමළ / ඉංග්‍රීසි යන භාෂා හැසිරවීම පිළිබඳ මනා පළපුරුද්දක් තිබීම.

**සැ.යු. :** තොරතුරු තාක්ෂණය සම්බන්ධව ලබා ඇති සුදුසුකම් අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**වයස :** අවුරුදු 22 නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය :** MA 1-1 - 2016

**වැටුප් පරිමාණය රුපියල් :** 27,910 - 10x300 - 7x350 - 4x495 - 20x660 - 48,540/- (කළ. සේ.චක්‍ර. අංක 02/2016 ට අනුව)

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත නිලධාරියා පත්කරනු ඇත.

- **පත්වීමේ ස්වභාවය :**
  සියලුම පත්වීම් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩලයේ දායකත්වය ලැබෙන ස්ථිර පත්වීමක් වේ.
- මෙම සේවා ගණය සඳහා බඳවා ගන්නා සහ උසස් කිරීම් සියල්ලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්ය පරිපාටියට අනුකූල වේ.
- නිලධාරීන් බඳවා ගැනීමෙන් අනතුරුව රැකියා කොන්දේසි හා අදාල කරුණු අධිකාරියේ කාර්ය පරිපාටි සංග්‍රහය අනුව සිදු කෙරේ.
- **අයදුම් කරන පිළිවෙල :**
  අයදුම් කරන එක් තනතුරක් සඳහා තැපැල් කාර්යාලය මගින් අධ්‍යක්ෂ ජනරාල්, නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යන නමට ලියූ රු. 200/- ක මුදල් ඇණවුමක් සහිතව සම්පූර්ණ ජීවදත්ත විස්තර ඇතුළත් අයදුම් පත්‍රයක් සමග උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත්‍රය, සියලුම අධ්‍යාපන සහතික හා පළපුරුද්ද දක්වෙන සියලුම සහතිකවල ජායාස්ථිත පිටපත් "සභාපති, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, ඇතුලු වරාය පාර, ත්‍රිකුණාමලය" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2016.10.05 දිනට පෙර එවිය යුතුය.

(**සැ.යු. :** දැනටමත් සේවයේ යෙදී සිටින නිලධාරීන් ආයතන ප්‍රධානී මගින් ඉල්ලුම් කළ යුතුය. තනතුර සඳහා තෝරාගතහොත් නිත්‍ය සේවයෙන් නිදහස් කරන බවට ආයතන ප්‍රධානී සහතිකකොට තිබිය යුතුය)

**සභාපති,**
**නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,**
**ඇතුලු වරාය පාර, ත්‍රිකුණාමලය.**